
## පාඩම : විකසන

1) <u>ඝනකාභයක ඝනත්වය ඇඳීම</u>

රූපයේ දැක්වෙන ඝනකාභයේ විකසනය අඳිමු. ( මිණුම් දක්වා ඇත්තේ mm වලිනි.)




I. ඉහළට සහ පහළට ඉඩ තිබෙන පරිදි තිරස් රේඛාවක් අඳින්න.

II. ඝනකාභයේ දිග හා පළලට සමාන දුරක් එනම් 40 mm ක් කවකටුවට ගෙන එම රේඛාවේ කොටස් 4ක් ලකුණු කරන්න.

III. ලකුණු කළ ස්ථාන වලින් රේඛාවට ලම්භක රේඛා අඳින්න.


IV. ඝනකාභයේ උස එනම් 30mm කවකටුවට ගෙන ලම්භක රේඛා මත ලකුණු කරන්න.

V. පියන සහ පතුළ ඇඳීම සඳහා ලම්භක රේඛා ඉහළට හා පහළට දිගු කර 40 mm × 40mm (දිග × පළල) සමචතුරස්‍ර 2ක් අඳින්න.

VI. ඇතුළත රේඛා කඩ ඉරි වලින් ඇඳ අනවශ්‍ය රේඛා මකන්න.

2) <u>සමචතුරස්‍රාකාර ප්‍රිස්මයක විකසනය ඇඳීම</u>

රූපයේ දැක්වෙන ප්‍රිස්මයේ විකසනය අඳිමු. ( ගිණුම් දක්වා ඇත්තේ mm වලිනි.)




I. ඉහළට සහ පහළට ඉඩ තිබෙන පරිදි තිරස් රේඛාවක් අඳින්න.

II. ප්‍රිස්මයේ දිග හා පළලට සමාන දුරක් එනම් 30 mm ක් කවකටුවට ගෙන එම රේඛාවේ කොටස් 4ක් ලකුණු කරන්න.

III. ලකුණු කළ ස්ථාන වලින් රේඛාවට ලම්භක රේඛා ඇඳ ඒවා මත 40mm බැගින් ලකුණු කරන්න, ඒම ලක්ෂ යා කරන්න.

IV. පියන සහ පතුළ ඇඳීම සඳහා එම ලම්භක රේඛා ඉහළට හා පහළට දිගු කර 30 mm × 30mm (දිග × පළල) සමචතුරස්‍ර 2ක් අඳින්න.

V. ඇතුළත රේඛා කඩ ඉරි වලින් ඇඳ අනවශ්‍ය රේඛා මකන්න.